
# විමංසනා



## හැම කවියක් ම ඒ මොහොත තුළ ඍජුව හෝ වක්‍රව ඒ මොහොතේ දේශපාලනය නියෝජනය කරනවා.

- රුවන් බන්දුජීව -

***නූතන පරපුරේ සළකුණුගත කවියෙකු වන රුවන් බන්දුජීව, 2013 වර්ෂයේදී සිය "මීළඟ මීවිත" කාව්‍ය සංග්‍රහය උදෙසා වසරේ හොඳ ම කාව්‍ය සංග්‍රහයට හිමි විද්‍යෝදය සම්මානය සහ ගොඩගේ සාහිත්‍ය සම්මානය දිනා ගන්නා ලදී. පහතින් දැක්වෙනුයේ කවිය, කාව්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ඔහු සමඟ සිදු කරනු ලැබූ සංවාදයකි.***

**ඔබ පිළිබඳ කෙටි විස්තරයක් කළොත්...**

මම මුලින් ම ගියේ පිළියන්දල කණිෂ්ඨ විද්‍යාලයට, පහේ ශිෂ්‍යත්වය සමත් වුණා ම මම කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුල් වුණා. වාණිජ අංශයෙන් උසස් පෙළ සමත් වී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන උපාධිය ලබා ගනු ලැබුවා.

**ඔබ කවියට නැඹුරු වූ අයුරු...**

ඒ ගැන කතා කරද්දි අපි හැමෝට ම වගේ මටත් කුඩා කාලෙ ඉඳන් පාසලේදි සහ අවට පරිසරයෙදි ඇහුණු සහ කියවන්න වුණු කවි මටත් පොදුවේ විඳින්න ලැබුණා. නමුත් කවිය සුවිශේෂ ලෙස දැනුණෙ විශ්වවිද්‍යාලයේ දි, සරසවි කුරුටු ගී දැකල, කියවලා විඳල එයින් ලැබූ පන්නරයෙන් තමයි කවියට නැඹුරු වුණේ, කවි ලියන්න පෙළඹුණේ.

**ඔබගේ නිර්මාණ කෘති ගැන කතා කළොත්...**

මගේ මුල් ම නිර්මාණ කෘතිය වෙන්නෙ 2008 දී එළි දැක්වූව "ඇල්කොහොල් නොමැති සඳ" කෘතියයි. මෙහි අන්තර්ගත වුණේ සරසවි කුරුටු ගී හා සමපාත නිර්මාණ. ඒ වගෙම 2013 වසරෙදි "මීළඟ මීවිත" කියන කවි පොත එළිදක්වනු ලැබුවා.

**ඔබගේ නිර්මාණයන්ගෙ පදනම කුමක්දැ'යි කෙනෙකු විමසුවොත්...**

එහෙම පදනමක් කියල වෙන් කරපු නිශ්චිත එකක් නැහැ. තිබෙන්නෙ එකතුවක්. මට පුද්ගලිකව හැඟෙන හැටියට යම් නිර්මාණයකට පදනමක් හැදෙන්නෙ ඒ මොහොතේ ඉස්මතුවෙන සහ ඒවා අතරින් මූලික වන සියලු හේතුන්ගෙ එකතුවකින් කියලා. එය තීරණය වන්නෙ කාලානුරූපව වගේ ම අවස්ථානුකූලව යි.

**ඔබගේ නිර්මාණයන්ගෙ අරමුණ කවරාකාරද?**

එයත් පෙර පරිදි ම යි නිශ්චිත අරමුණක් කියලා උලුප්පලා පෙන්නනවට වඩා ඒ මොහොත තුළ කෙනෙක් විශ්වාස කරන දේ මතුවෙනවා වගේ අදහසක් මට තියෙන්නෙ. යම් අවස්ථාවක කෙනෙක් සමාජීය සිද්ධියකින් කම්පනයට පත් ව දේශපාලනික වශයෙන් තමන් විශ්වාස කරන සහ තමන්ට දැනෙන දේ කවියට නඟල ප්‍රකාශ කරනවා වෙන්න පුලුවන්. ඒවගේ ම කෙනෙක් යම් ස්වයං තෘප්තියක් බලාපොරොත්තුවෙන් ලියනව වෙන්නත් පුලුවන්.

**නූතනයේ කාව්‍ය ප්‍රකාශනාත්මක විධීන්හි වර්ධනයක් දකින්නට ලැබෙනව. අන්තර්ජාලය පැමිණීමත් සමගම මේ පදාසයේ පුළුල් වීමක් දැක ගන්න පුලුවන්. මේ පිළිබඳ ඔබගේ දෘෂ්ඨිය කවරාකාර ද?**

ඇත්තෙන්ම මට මෙය දැනෙන්නෙ සාධනීය දෙයක් විදියට. කොහොම වුණත් අන්තර්ජාලය කියන්නෙ කවිය ප්‍රකාශ කරන්න තියෙන එක් මාධ්‍යයක් පමණ යි. එතකොට ඊට අමතර ව පොත්වල, සඟරාවල කවි පළ වෙනවා. ඇතැම් වෙලාවට අන්තර්ජාලයේ මුලින් පළවෙන කවි පසුව පොතක ස්වරූපයෙන් පිට වෙනවා. මුලින් ම පොත්වල පළවෙන කවි පසුව අන්තර්ජාලයට එක්කාසු වෙනවා. ඒවා අතර හුවමාරු වීමේ අන්තර් සම්බන්ධයක් තියෙනවා. මෙතනදි අන්තර්ජාලයට කවි මුදාහරින පිරිසක් වගෙම එම කවි කියවන පිරිසකුත් ඉන්නව. ඒ කවි කියවල සමහරු යම් උත්තේජනයක් ලබලා කවි ලියන්න පෙළඹෙනවා. Facebook එකේ නැති පරිණත කවියන්ගෙ විශිෂ්ඨ කවි Facebook හි හුවමාරු වන බව ප්‍රසිද්ධ කාරණයක් ඒවගේ ම කවි පළ කරන පිරිසට ලැබෙන තවත් දෙයක් තමා තමයි නිර්මාණ ගැන යම් ප්‍රතිපෝෂණයක් ලැබීමට තියෙන අවස්ථාව ඉහළ යෑම. එතුළින් නිර්මාණකරුවන්ට තමන්ගේ නිර්මාණ පිළිබඳව කිසියම් ස්වයං විනිශ්චයකට එළඹෙන්නට පුලුවන්. ඒ කෙසේ වුවත් ස්වයං විනිශ්චයේ දී එය ඇතැම් විට අවතක්සේරු හෝ අධිතක්සේරු වෙන්න පුලුවන්.

**නූතන කවිය පොදු සමාජයෙන් දුරස් එකක් වන බවට කවුරුන් හෝ තර්ක කළොත්...**

නූතනයේ කවිය ජනතාවගෙන් දුරස් ය කියල කියලා එක එල්ලේ ම කියන්න බැහැ. නිර්මාණ ධාරාවන් තුළින් පොදුවේ අපි හැමෝගෙම ජීවිත සමීප විදිහට අර්ථ දැක්වෙන අවස්ථාවල මේ කියන දුරස් බව අඩු වෙනවා.

**"තමා ජීවත්වන සමාජයේ යථාර්ථය නිරූපණය කිරීම කලාකරුවාගේ සමාජ වගකීම වේ" යන මතය සම්බන්ධව ඔබගේ මතය කුමක්ද?**

ඒ ගැන මට හිතෙන්නෙ සමාජ යථාර්ථය කියලා අපි පුද්ගලිකව විග්‍රහ කරගන්නෙ සමාජය පිළිබඳ කෙනෙක්ට තියෙන පෞද්ගලික මතය කියන එක. ඒ මතයට පරිබාහිරව තියෙන, පරිසරය ඇතුළෙ කැකෑරෙන සාධක ටික කලවම් වුණා ම බිහිවෙන සමාජ යථාර්ථය සහ කලින් කිව්ව පුද්ගලිකව නිර්මාණය කරගන්න සමාජ යථාර්ථය අතරෙ යම් හිදැස්සක් නිර්මාණය වන අතරම ඒ අවකාශය තේරුම් ගැනීම සඳහා අපිට එකිනෙකාගෙ සහයෝගය අවශ්‍යයි.

**කවිය දේශපාලනික විය යුතු ද? නැති ද? මේ පිළිබඳව ඔබගේ මතය කුමක්ද?**

කවිය දේශපාලනික ද? නැති ද? යන්න තීරණය කරන්නෙ, ස්වයං අර්ථ දැක්වීමට හැඩ ගැහෙන්නෙ කවිය කියවමින් කවිය තුළට ඇතුල්වෙන පුද්ගලයා යි. කොතරම් දේශපාලනිකයි කියලා කෙනෙක් හිතලා ලියන කවියක් වුවත් කියවන කෙනා ඒ කවිය ග්‍රහණය කර ගන්නෙ එහෙම නෙවෙයි නම් නිර්මාණකරුවගෙ පරමාර්ථය ඉෂ්ඨ වෙන්නෙ නෑ. ඒවගෙමයි කෙනෙක් කරන නිර්මාණයක් සෘජු දේශපාලනික අර්ථ සහිත කවියක් නොවෙන්න පුලුවන්. නමුත් කියවන කෙනා ඒක දේශපාලනික අර්ථයකින් කියව ගන්නවා වෙන්න පුලුවන්. කවුරුහරි ලියන හැම කවියක් ම ඒ මොහොත තුළ සෘජුව හෝ වක්‍රව ඒ මොහොතේ දේශපාලනය නියෝජනය කරනවා. මෙකෙ අතිත් අර්ථය වෙන්නෙ කවියක් අරගෙන එය දේශපාලනික න්‍යායන් හෝ මූලධර්ම මත පමණක් ම විග්‍රහ කරන්න යාම තුළ අපට යම් යම් කරුණු මග හැරී යා හැකි බවයි.

**නූතනයේ සරසවි ප්‍රජාව කවිය, කලාව සම්බන්ධව, දක්වන දායකත්වය අඩු බවට කවුරුන් හෝ තර්ක කළොත්?**

ඒ අදහසට, තර්කයට මම එකඟ නැහැ. මොකද සරසවි පද්ධතිය තුළ කවි විශාල වශයෙන් ලියැවෙනව. ඒවා විවිධාකාරයි. සීයට වැඩි ප්‍රතිශතයකින් අව්‍යාජයි. ඉතා ම නිර්මාණශීලී යි. ඒත් ඔවුන්ගේ දායකත්වයට සාපේක්ෂව ඒවා තිරසාර විදිහට සරසවි පද්ධතිය තුළට අවශෝෂණය කරගන්න තියෙන ක්‍රමවේදයන්ගේ අඩුවක් තමා පේන්න තියෙන්නෙ. බහුතරයක් විශ්වවිද්‍යාල ආචාර්යවරු විෂය මූලික දේශන රටාවට ම අනුගත වී ඇති බව ප්‍රසිද්ධ කාරණයක්. බොහොමයක් සරසවි ඇතුළෙ කලා උළෙලයන්, සාහිත්‍ය සංවාද, කතිකාවන් තියෙනවා. ඒ වැයම් සහ සරසවි සිසුන් අතරෙ සබැඳියාවක් හදන්න අර කලින් කිව්ව ආචාර්යවරුන්ගෙන් ක්‍රියාත්මක වෙන්නෙ අතළොස්සයි, පරිපාලනමය වශයෙන් සහයෝගය ලබා දෙනවා වෙනුවට හුඟක් වෙලාවට වෙන්නෙ ඒකෙ අනිත් පැත්ත.

**සාහිත්‍ය සම්මාන උළෙලයන් පිළිබඳ ඔබගේ අදහස...**

සාහිත්‍ය කෘතියක සාධනීය බව මැනීම කියන කාරණය බරපතළ එකක් බව පිළිගත යුතු යි. භෞතික තත්ත්වයන්ගේ විචලනයන් වගේ දේවල් නම් මැනීමට උපකරණ තිබෙනව, මිනුම් ක්‍රමවේද තියෙනව. නමුත් කලා නිර්මාණ කිහිපයක් එක පේළියට තියලා වඩා ප්‍රශස්ත කලා කෘතිය තෝරන එක ඊට ඉඳුරාම වෙනස් වැඩක්. සම්මාන උත්සව කිහිපයක් ගතහොත් බොහෝ විට සම්මාන හිමි වන්නේ එකම කෘතියට නෙවෙයි කිහිපයකට වෙන්න පුලුවන්. ඒ ඒ සම්මාන උළෙලයන් නියෝජනය කරන, විනිශ්චයන් ලබාදෙන අයගෙ වරණයන් සහ දේශපාලන දෘෂ්ටීන් අනුව ඒක තීරණය වෙනවා විය හැකියි.

**නූතන කවියන් නව ආකෘති සොයා යාම සම්බන්ධව ඔබගේ අදහස...**

අත්හදා බැලීම කියන දේ තමා වැදගත් ම. අත්හදා බැලීම් කළ යුතු ම යි. එම අත්හදා බැලීම් මේ මොහොත තුළ කියවන කෙනෙකුට ගැළපෙන්නෙ හෝ හොඳ නැති වෙන්න පුලුවන්. නමුත් ඊළඟ මොහොතෙ නැවත ඒවා හොඳ වෙන්නත් පුලුවන්. අනෙක් අතට මේ මොහොත තුළ සාර්ථක වන අත්හදා බැලීම ඊළඟ මොහොතේ අසාර්ථක වෙන්නත් පුලුවන්. නමුත් වැදගත් වෙන්නෙ මෙම අත්හදා බැලීම් සහිත ක්‍රියාවලිය නොනවත්වා ඉදිරියට ගෙනයාමට දායක වීම යි.

**සංවාදය-ධනුෂ්ක චන්දන රත්නායක**

